සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

# පෙරහුරු පරික්ෂණය - (2024) 2025

11 ශ්‍රේණිය
Grade 11

## කෘෂි හා ආහාර තාක්ෂණය I- II

පැය තුනයි

අතිරේක කියවීම් කාලය : මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

නම-:..................................................  විභාග අංකය-:............................

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (×) ලකුණ යොදන්න.

### 1 පත්‍රය

01. වැවක සොරොව්වෙන් පිටවන ජලයේ පීඩනය පාලනය කිරීම සඳහා සකසා ඇති ව්‍යුහය වනුයේ,
1. වැව් බැම්ම ය.  2. රළපනාව ය.  3. බිසෝ කොටුව ය.  4. වාන් දොරටු ය.

02. ශාකවල වර්ණක සංශ්ලේෂණයට, ධාන්‍ය බෝගවල පඳුරු දැමීමට සහ සංචිත ආහාර ප්‍රමාණය වැඩි කිරීම සඳහා සෘජුවම බලපාන දේශගුණික සාධකය වන්නේ,
1. සුළඟ  2. සාපේක්ෂ ආර්ද්‍රතාව  3. උෂ්ණත්වය  4. ආලෝක තීව්‍රතාව

03. ශ්‍රී ලංකාවේ වියළි කලාපයට වැසි ලැබෙන ප්‍රධාන ක්‍රම වනුයේ,
1. නිරිත දිග මෝසම් හා පළමුවන අන්තර් මෝසම් ය.
2. නිරිත දිග මෝසම් හා ඊසාන දිග මෝසම් ය.
3. ඊසාන දිග මෝසම් හා දෙවන අන්තර් මෝසම් ය.
4. නිරිත දිග මෝසම්, ඊසාන දිග මෝසම් හා අන්තර් මෝසම් ය.

04. බෝග වගා කරන ප්‍රධාන උපස්ථරය හෙවත් වගාමාධ්‍ය වන්නේ පසය. මෙහිදී පස මගින් ඉටු කෙරෙන සුවිශේෂී කාර්යයක් නොවන්නේ,
1. පාංශු ජීවීන්ට වාසස්ථානයක් සැකසීම.
2. වර්ෂා ජලය අවශෝෂණය කර තබාගෙන එය ශාක වෙත ලබාදීම.
3. කාබන් මූලද්‍රව්‍ය ශාකවලට ලබාදීම.
4. ශාකවල සන්ධාරක කෘත්‍ය ඉටු කිරීම.

05. ශ්‍රී ලංකාවේ දැකිය හැකි මූලික පාංශු ව්‍යුහ ආකාර අතරින් බහුලව දැකිය හැකි ව්‍යුහ ආකාරය වනුයේ,
1. කැටිති ව්‍යුහය.  2. අනුකෝණාකාර කුට්ටි ව්‍යුහය.
3. ස්ථම්භික ව්‍යුහය.  4. තනි තණිකා ව්‍යුහය.

06. පහත බෝග අතුරින් මැල්වේසියේ කුලයට පමණක් අයත් බෝග කාණ්ඩය වනුයේ,
1. වට්ටක්කා, බණ්ඩක්කා  2. කපු, රටකපු
3. බණ්ඩක්කා, කපු  4. ගෝවා, බතල

07. පහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. පැළ අතර වැඩි පරතරයක් අවශ්‍ය වන බෝග සංස්ථාපනය සඳහා සුදුසු වන්නේ තනි වගා වළවල් ය.
2. බතල, ඉන්නල වැනි බෝග සිටුවීමට යෝග්‍ය වනුයේ උස් පාත්තිය.
3. බඩ ඉරිඟු බීජ සංස්ථාපනය සඳහා දෙපේළි ක්‍රමය වඩා යෝග්‍ය ය.
4. කුරක්කන් බෝගය සංස්ථාපනය සඳහා තවාන් පැළ යොදා ගනී.

දර්ශීය පාංශු  පැතිකඩක රූපසටහනක් පහත දැක්වේ. ඒ අනුව අංක 8 සහ 9 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




08. පසේ A හා B කලාප නිර්මාණය වීමට වැදගත් වන කලාපය වන්නේ,
   1. R කලාපය.   2. O ස්ථරය.   3. C කලාපය.   4. R හා C කලාපය.

09. පාංශු පැතිකඩෙහි පාංශු ගැඹුර ලෙස දැක්විය හැක්කේ,
   1. A හා B කලාපවල උස ය.   2. A, B හා C කලාපවල උස ය.
   3. A, B, C හා R කලාපවල උස ය.   4. B, C හා R කලාපවල උස ය.

10. බඩ ඉරිඟු, මුං, කව්පි වැනි බෝග සංස්ථාපනය සඳහා යොදාගත හැකි උපකරණයකි.
   1.රිජරය   2. ටුල් කැරියර්
   3. FMRC ගොඩ බීජ වප්කරය   4. ජපන් රොටරි වීඩරය

11. තවාන් ජීවාණුහරණයේ දී විනිවිද පෙනෙන පොලිතීනයකින් තවාන් සම්පූර්ණයෙන් ආවරණය කිරීමේ අරමුණ වනුයේ,
   1. තවාන හොඳින් ජීවාණුහරණය වී ඇතිදැයි හඳුනා ගැනීම පහසුවීමට ය.
   2. නිසි පරිදි ජීවාණුහරණය වීමට අවශ්‍ය වාතය රඳවා ගැනීමට ය.
   3. තවාන් මිශ්‍රණයෙහි උෂ්ණත්වය වැඩි කර ගැනීමට ය.
   4. තවානට බාහිරින් රෝග කාරකයින් ඇතුළුවීම වැළැක්වීමට ය.

12. අධික වර්ෂාපතනයක් සහිත, ජලවහනය දුර්වල පසකට වඩාත් සුදුසු පාත්ති වර්ගය වනුයේ,
   1. උස් පාත්ති ය.   2. තනි වගා වළවල් ය.   3. ගිල් වූ පාත්ති ය.   4. බඳුන් තවාන් ය.

13. අයහපත් ජලවහන තත්ත්වයක් නිසා පසේ ඇතිවන ගැටලුවක් වන්නේ,
   1. පසේ වාතනය යහපත් වීමය.   2. පසේ උෂ්ණත්වය ආරක්ෂා වීමය.
   3. කාබනික ද්‍රව්‍ය වියෝජනය හොඳින් සිදුවීම.   4. මූල පද්ධතිය පසේ මතුපිට ස්ථරවල පැතිරීම.

14. ඉසින ජල සම්පාදන ක්‍රමය පිළිබඳ සත්‍ය ප්‍රකාශ වන්නේ,
   A - වර්ෂාවක් ලෙසින් බෝගයට ජල සම්පාදනය කළ හැකිය.
   B - බෑවුම් සහිත භූමිවලට ද යොදාගත හැකිය.
   C - සුළං අධික ප්‍රදේශ වලට ද යොදාගත හැකිය.
   D - අතුරුයත් ගෑමේ කටයුතු බාධාවකින් තොරව සිදුකළ හැකිය.
   1. A හා B   2. A හා D   3. B හා D   4. C හා D

15. අත්‍යවශ්‍ය ශාක පෝෂක අතරින් ශාකවල පුෂ්පීකරණය සහ ඵල හට ගැනීමට අවශ්‍ය ප්‍රධාන පෝෂකය වන්නේ,
   1. නයිට්‍රජන්   2. පොස්පරස්   3. පොටෑසියම්   4. කැල්සියම්

16. ගොඩක්‍රමයට කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ දී කොම්පෝස්ට් ගොඩේ උපරිම පළල 1.8m පවත්වා ගත යුතුය. මෙයට ප්‍රධාන හේතුව වන්නේ,
   1. පළල වැඩිවූ විට ගොඩ පෙරළීම අපහසුය.
   2. පළල වැඩිවූ විට අමු ද්‍රව්‍ය ජීර්ණය සඳහා වාතාශ්‍රය ප්‍රමාණවත් නොවීමය.
   3. එම පළල පවත්වා ගැනීමෙන් උපරිම නිෂ්පාදනයක් ලබාගතහැකි වීමය.
   4. පළල වැඩිවූ විට මුහුම් එක්කර මිශ්‍ර කිරීම අපහසු වීම.

17. වල්පැළෑටි අතරින් ගොඩබිම වැඩෙන බහු වාර්ෂික වල්පැළෑටියක් වන්නේ,
   1. මොනර කුඩුම්බිය.   2. කුප්පමේනියා.   3. කළාදුරු.   4. කුඩමැට්ට.

18.  යුෂ උරාබොන කෘමීන් මගින් හෝ ශාක වල යාන්ත්‍රික හානි සහිත ස්ථාන වලින් ශාක තුළට ඇතුල්වන රෝග කාරකයා වනුයේ,
   1. දිලීර   2. වෛරස්   3. බැක්ටීරියා   4. වටපණුවන්

19. කෘමි පළිබෝධ පාලනයේ දී පිටත සිට වගා භූමිය තුළට පළිබෝධ සතුන් ඇතුළු වීම වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් වනුයේ,
1. බිම් සැකසීමේ දී හොඳින් පස පෙරළීම.
2. බෝග මාරුව.
3. නීති අණපනත් ක්‍රියාවට නැංවීම.
4. පස ජීවානුහරණය කිරීම.

20. වී වගාවේ මඩ ක්‍රමයට බිම් සැකසීම සඳහා ගතවන කාලය වනුයේ,
1. දින 7 කි.
2. දින 14 කි.
3. දින 21 කි.
4. දින 40 කි.

21. වී වගාවේ කිරි වදින බීජ වල යුෂ උරාබීම සිදුකරන පළිබෝධකයෙකි.
1. ගොයම් මකුණා
2. පැළ මැක්කා
3. කීඩෑවා
4. ගොඩවෙල්ලා

22. බීජ ප්‍රරෝහණයට අවශ්‍ය සාධක අතුරින් ආලෝකය අත්‍යවශ්‍ය වන්නේ කුමන බීජ කාණ්ඩය සඳහා ද?
1. සළාද, වී
2. සළාද, කෝලියාස්
3. මෑ, වම්බටු
4. වට්ටක්කා, වම්බටු

23. ශාකයේ පාදස්ථයට ආසන්නව කඳෙන් හටගන්නා භූගත ශාකවල ආහාර තැන්පත් කිරීමෙන් හටගන්නා ස්වාභාවික වර්ධක ප්‍රචාරණ ව්‍යුහය වන්නේ,
1. රෛසෝමය
2. කෝමය
3. බල්බය
4. ස්කන්ධ ආකන්දය

24. ශාක අතු කැබලි වල මුල් ඇදීම වේගවත් කිරීමට කළයුතු ක්‍රියාකාරකමක් වනුයේ,
1. රෝපණ මාධ්‍යයට රසායනික පොහොර එක් කිරීම.
2. රෝපණ මාධ්‍යයේ තෙතමනය වැඩි කිරීම.
3. දඬු කැබැල්ල අවට වැඩි උෂ්ණත්වයක් හා වැඩි අර්ද්‍රතාවයක් ලබාදීමය.
4. දඬු කැබැල්ල අවට අඩු උෂ්ණත්වයක් හා අඩු ආර්ද්‍රතාවක් ලබාදීමය.

25. රූප සටහනේ දැක්වෙන ආකාරයට බීජ ප්‍රරෝහණය පෙන්නුම් කරන බීජ කාණ්ඩය වනුයේ,




1. කඩල, මෑ
2. බෝංචි, කඩල
3. බෝංචි, මිරිස්
4. බඩ ඉරිඟු, මෑ

26. නිර්පාංශු වගා ක්‍රමයේ දී යොදා ගන්නා ද්‍රව (පෝෂණ) මාධ්‍ය තුළ සිදු කෙරෙන වගා ක්‍රමයක් වනුයේ,
1. මුල් ගිල් වූ වගාව ය.
2. සිරස් මලුවල වගාව ය.
3. තිරස් මලුවල වගාවය .
4. කානු හෝ පාත්තිවල වගාවය.

27. බෝග වගාවේ දී පාලිත තත්ත්ව ලබාදීම සඳහා භාවිත කරන ලී පටි ගෘහ පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - සෙවන ප්‍රිය කරන ශාක වගා කිරීම සඳහා සුදුසු ව්‍යුහයකි.
B - ඇන්තූරියම් ඕකිඩ් ජර්බෙරා වැනි විසිතුරු ශාක සඳහා යෝග්‍යයි.
C- බෝගයට සෙවන ලබාදීම පමණක් නොව සුළං හානි හා කෘමි හානි ද වළක්වා ගත හැක.
සත්‍ය ප්‍රකාශන වනුයේ,
1. A හා B ය.
2. A හා C ය.
3. B හා C ය.
4. A,B හා C ය.

28. එක් බෝගයක ජීවන චක්‍රය අවසන් වීමට පෙර තවත් බෝගයක් පළමු බෝග අතර ස්ථාපනය කිරීමෙන් බෝග වර්ග දෙකක් හෝ කිහිපයක් එකම භූමියක වගා කරන බෝග වගා රටාව වනුයේ,
1. කඩින් කඩ භෝග වගාව
2. අතුරු බෝග වගාව
3. මිශ්‍ර බෝග වගාව
4. ශෂ්‍ය බෝග වගාව

29. වර්ෂාව හා පින්න ඇති විට අස්වනු නෙළීම නිසා ගබඩා කාලය අඩුවීම හා පහසුවෙන් රෝග වලට ගොදුරු වන පලතුරු කාණ්ඩය වනුයේ,
1. අඹ හා පැපොල්
2. මිදී හා ස්ට්‍රෝබෙරි
3. වැල් දොඩම් හා අන්නාසි
4. අලිපේර හා කෙසෙල්

30. මිනිස් ශරීරයේ තයිරොක්සීන් නිෂ්පාදනය කෙරෙහි බලපාන ඛනිජය වනුයේ,
1. කැල්සියම්
2. යකඩ
3. අයඩින්
4. පොටෑසියම්

31. ආහාර නරක් වීම කෙරෙහි බලපාන ප්‍රධාන බැක්ටීරියාවක් වන Salmonella spp මගින් නරක් වීමට බඳුන් වන ආහාර කාණ්ඩය වනුයේ,

1. නොපිසන මස්, මාළු හා බිත්තර
2. අඹරන ලද හරක් මස්, බර්ගර් මස් නිෂ්පාදන හා කිරි
3. ධාන්‍ය, ජලය, බත්
4. රට කජු, කොප්පරා, තක්කාලි සෝස්

32. ආහාර පැස්ටරීකරණය සිදුකරන වැඩි උෂ්ණත්වය අඩු කාල ක්‍රමයේ දී (HTST) ආහාර නිරාවරණය කරනු ලබන නිවැරදි උෂ්ණත්වය හා කාලසීමාව වනුයේ,

1. $62^{O}C$ උෂ්ණත්වයේ තත්පර 30 කාලයට නිරාවරණය කිරීම.
2. $62^{O}C$ උෂ්ණත්වයේ තත්පර 15 කාලයට නිරාවරණය කිරීම.
3. $72^{O}C$ උෂ්ණත්වයේ තත්පර 15 කාලයට නිරාවරණය කිරීම.
4. $72^{O}C$ උෂ්ණත්වයේ තත්පර 30 කාලයට නිරාවරණය කිරීම.

33. කෝඩියල් හා ජෑම් ආදී ආහාර වර්ග නිෂ්පාදනයේ දී බෙන්සොයික් අම්ලය යොදා ගැනීමේ අරමුණ වනුයේ,

1. නැවුම් පැහැය ආරක්ෂා කර ගැනීමට ය.
2. රසය වැඩි කර ගැනීමට ය .
3. යීස්ට් හා පුස් වර්ග විනාශ කිරීමට ය.
4. පෝෂණ ගුණය ඉහළ දැමීම සඳහා ය.

34. ගව පාලන කලාපයක් වන පොල් ත්‍රිකෝණය සඳහා වඩාත් සුදුසු ගව වර්ග ඇතුළත් පිළිතුර වනුයේ,

1. ජර්සි, සහිවාල්, AMZ
2. ෆ්‍රීෂියන්, අයර්ෂයර්, ජර්සි
3. සහිවාල්, අයර්ෂයර්, AMZ
4. ජර්සි, අයර්ෂයර්, AFS

35. බිත්තර දමන කිකිළියන්ගේ වර්ධක අවධිය ලෙස සැලකෙන්නේ,

1. සති 1-2 කාලය යි.
2. සති 2-8 කාලය යි.
3. සති 8 – 18 කාලයයි.
4. සති 18න් පසු කාලයයි.

36. සත්ත්ව පෝෂණයේ දී ලබාදෙන දළ ආහාර හා සාන්ද්‍ර ආහාර අතර වෙනස්කම් කීපයක් පහත දැක්වේ.

| | දළ ආහාර | සාන්ද්‍ර ආහාර |
|---|---|---|
| A | ප්‍රෝටීන් හා ශක්තිය අඩුය. | ප්‍රෝටීන් හා ශක්තිය වැඩිය. |
| B | දළ තන්තු වැඩිය. | දළ තන්තු අඩුය. |
| C | දිරවීම ඉක්මනින් සිදුවේ. | දිරවීම සෙමින් සිදුවේ. |
| D | එන්සයිම මගින් ජීර්ණය සිදුවේ. | ප්‍රධාන වශයෙන් ක්ෂුද්‍ර ජීවීන් මගින් සිදුවේ. |

මින් නිවැරදිව ගලපා ඇති පිළිතුර වනුයේ ,

1. A හා B ය.
2. B හා C ය.
3. A හා C ය.
4. C හා D ය.

37. කුකුල් පාලනය සිදු කරන ගොවිපළක් නිරීක්ෂණයේ දී එක් කූඩුවක සතුන් එකට ගුලිවී සිටිනු දක්නට ලැබුණු අතර ජම්බාලිය වටා සුදු පැහැති මල තැවරී තිබෙණු දක්නට ලැබුණි.
මෙම නිරීක්ෂණ අනුව වැළඳී ඇති රෝගය විය හැක්කේ,

1. රානිකට්ය.
2. පුල්ලෝරමය.
3. කොක්සිඩියෝසිස්ය.
4. පණු රෝගයකි.

38. කුකුළු පාලනයේ දී අතුරණුව පාලනය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - අතුරණුව වියළි බවට පත් වීමෙන් වළක්වා ගත යුතුය.
B - තෙතමනය අඩු කිරීම සඳහා අළු හුණු එකතු කර මිශ්‍ර කරණු ලැබේ.
C - ඉතා කුඩා කොටස් ලෙස තිබුනද දූවිලි ආකාරයෙන් නොතිබිය යුතුය.
මින් සත්‍ය වන්නේ,

1. A හා B පමණි.
2. B හා C පමණි.
3. A හා C පමණි.
4. A, B හා C පමණි.

39. නවීකෘත අභ්‍යන්තර පරිසර තත්ත්ව යටතේ ආහාර ඇසිරීම සිදු කරන විට ඇසුරුම් තුළ ඇති ඔක්සිජන් වායුව ඉවත් කර පුරවනු ලබන වායු වනුයේ,

1. $H_2$ හා $CO_2$ ය.
2. $CO_2$ හා $Cl_2$ ය.
3. $N_2$ හා $H_2$ ය.
4. $CO_2$ හා $N_2$ ය.

40. පාරිභෝගිකයෙකු මිලදී ගත් ආහාර කිහිපයක් නිවසට රැගෙන ආ විට ඒවායේ ගුණාත්මය පරීක්ෂා කිරීමේ දී ලැබුණු නිරීක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - පිරිසිදු ජලය අඩංගු බඳුනකට තේ කොළ යෙදූ විට ජලය වර්ණ ගැන්වුණි.
B - නැවුම් කිරි බිංදු කිහිපයක් පිරිසිදු ජලය ඇති විදුරුවකට දැමූ විට ඉතා සෙමින් පහළට ගමන් කිරීම.
C - ගම්මිරිස් නියැදියක් ජලයට යෙදූ විට සියලුම ඇට ජලයේ ගිලුණි.
මෙම නිරීක්ෂණ අතුරින් ගුණාත්මයෙන් යුතු පරිභෝජනයට සුදුසු ආහාර ද්‍රව්‍ය වනුයේ,

1. A හා B ය.
2. B හා C ය.
3. A හා C ය.
4. A, B හා C සියල්ලම

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

# පෙරහුරු පරීක්ෂණය - (2024) 2025

11 ශ්‍රේණිය
Grade 11

## කෘෂි හා ආහාර තාක්ෂණය II

**පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පසුගිය කාලයේ ඇතිවූ අධික වර්ෂාපතනය හා ගංවතුර හේතුවෙන් තම වගාවන්ට සිදුවූ හානියෙන් අම්පාර ප්‍රදේශයේ ගොවි මහතුන් අධික ලෙස පීඩාවට ලක්වුණි.

i. මෙම ගොවි මහතුන් ජීවත්වන ප්‍රදේශය අයත් කෘෂි දේශගුණික කලාපය සඳහන් කරන්න.

ii. a. මෙම ප්‍රදේශයේ ගොවීන් වී ගොවිතැන් කටයුතු සිදුකරන්නේ කුමන කන්න යේද?
b. එම කන්නයට වර්ෂාව ලැබෙන වර්ෂාපතන ආකාරය සඳහන් කරන්න.

iii. මෙම ප්‍රදේශයේ බහුලව ව්‍යාප්ත වී ඇති පස් කාණ්ඩයේ භෞතික හා රසායනික ලක්ෂණය බැගින් සඳහන් කරන්න.

iv. a. අධික වර්ෂාපතනය හා ගංවතුර හේතුවෙන් බෝග වගාවන්ට ඇතිවිය හැකි ගැටලු දෙකක් සඳහන් කරන්න.
b. අධික වර්ෂාපතනය හේතුවෙන් සිදුවන පාංශු ඛාදනය අවම කිරීම සඳහා පස් අංශු එකිනෙකින් වෙන් වීම අවම කිරීමට යොදා ගත හැකි උපක්‍රමයක් සඳහන් කරන්න.

v. a. වී වගාවේ දී මෙම ගොවීන් බහුලව භාවිතා කරන ජල සම්පාදන ක්‍රමය සඳහන් කරන්න.
b. එම ජල සම්පාදන ක්‍රමයේ වාසි දෙකක් සඳහන් කරන්න.

vi. මෙම ගොවීන් මිශ්‍රබෝග වගා රටාවක් සඳහා අවතීර්ණය වූයේ නම් එහිදී වගා කළ හැකි කුකර්බිටේසියේ, ෆැබේසියේ, පොඒසීයේ හා සොලනේසියේ කුලයේ බෝගයක් බැගින් සඳහන් කරන්න.

vii. සොලනේසියේ කුලයේ බෝගවලට බහුලව වැළඳෙන රෝගයක් නම් කර රෝගකාරකයා හඳුන්වන්න.

viii. a බෝග වගා කරන ක්ෂේත්‍රයේ පාත්ති දැමීම ඇලි වැටි ක්‍රමයට සිදු කිරීමට තීරණය කළේ නම් ඒ සඳහා සුදුසු බිම් සැකසීමේ උපකරණය නම් කරන්න.
b. බෝග වගාවේ දී භාවිත කරන මිනිස් බලයෙන් ක්‍රියා කළ හැකි අතුරුයත්ගෑමේ උපකරණ දෙකක් නම් කරන්න.

ix.a.වගාවට අවශ්‍ය කොම්පෝස්ට් ලබාගැනීමට මෙන්මෙ වාණිජ ව්‍යාපාරයක් ලෙස මහා පරිමාණයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය කරන්නේ නම් වඩාත් සුදුසුම ක්‍රමය කුමක් ද?
b. කොම්පෝස්ට් වලට අමතරව භාවිතා කළ හැකි වෙනත් කාබනික පොහොර වර්ග දෙකක් සඳහන් කරන්න.

x. a. ගොවීන්ගේ අවධානය හා අඩමානයෙන් මිදීමට සමෝධානිත ගොවිතැනට යොමු වීමට උපදෙස් ලැබුණි නම් ගොවිපළ තුළ ඇති කිරීමට සුදුසු එළ ගව වර්ගයක් හා මී ගව වර්ගයක් සඳහන් කරන්න.
b. මෙම ගොවිපළේ සත්ත්ව පාලනයෙන් ලැබෙන අතිරික්ත කිරි නිෂ්පාදනය පරිරක්ෂණය කරන්නේ නම් ඒ සඳහා වඩාත් සුදුසු පරිරක්ෂණ ක්‍රමය කුමක් ද?

02. පරිසර සාධක සමඟ වගා කටයුතු ගලපා ගැනීමේ පහසුව සඳහා ශ්‍රී ලංකාව කෘෂි පාරිසරික කලාප 46 කට බෙදා දක්වා ඇත.

i. a. ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප තුන නම් කරන්න.
b. ඔබ ඉහත නම් කළ දේශගුණික කලාප තුනේ වාර්ෂික වර්ෂාපතන ප්‍රමාණයන් වෙන වෙනම ලියා දක්වන්න.

ii. a. පසේ ජීවත්වන මහාජීවීන් දෙදෙනෙකු නම් කරන්න.
b. පාංශු ජීවීන්ගේ වැදගත්කම් හතරක් ලියන්න.
c. පාංශු ජීවීන්ගේ බලපෑම නිසා පාංශු වාතයේ සංයුතිය වායුගෝලීය වාතයේ සංයුතියෙන් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

iii. a. පාංශු හායනය යනු කුමක්ද?
b. පාංශු හායනයට බලපාන හේතු දෙකක් ලියන්න.

03. බෝග වගාවේ දී වැඩි අස්වැන්නක් ලබා ගැනීමට බිම් සැකසීම, පොහොර යෙදීම, ජල සම්පාදනය යන ක්‍රියාවලි නිසි අයුරින් සිදු කළ යුතුය.
   i. a. බිම් සැකසීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න.
      b. ප්‍රාථමික බිම් සැකසීමේ දී සිදු කරන කාර්යයන් දෙකක් ලියන්න.
   ii. a.පසට පොහොර යෙදීමේ දී, මූලික පොහොර යෙදීම හා මතුපිට පොහොර යෙදීම අතර වෙනස සඳහන් කරන්න.
      b. පොහොර භාවිත කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් දක්වන්න.
   iii. a. බෝග වගාව සඳහා සුදුසුම පාංශු තෙතමන මට්ටම කුමක් ද?
      b. පාංශු ජලය සංරක්ෂණය කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.
      c. පහත සඳහන් බෝග සඳහා වඩාත් සුදුසු ජල සම්පාදන ක්‍රම නම් කරන්න.
         1. සෝයා බෝංචි, මුං ................................
         2. අඹ, රඹුටන්..........................................

04. බෝග වගාවේ දී උසස් ගුණාත්මයෙන් යුත් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට වල් පැළෑටි පාලනය කළ යුතුය.
   i. a. I. ආක්‍රමණශීලි වල්පැළෑටි යන්න අර්ථ දක්වන්න.
         II. ඒ සඳහා උදාහරණ දෙකක් දෙන්න.
      b. I. රූපාකාරය අනුව වල් පැළෑටි වර්ගීකරණය කරන්න.
         II. ඒවාට උදාහරණය බැගින් දෙන්න.
   ii.a. කුකර්බිටේසියේ කුලයේ බෝගවලට හානි කරන කෘමි පලිබෝධකයකු සඳහන් කරන්න.
      b. එම කෘමියා බෝගයට හානි සිදු කරන්නේ ජීවන චක්‍රයේ කුමන අවධියක ද?
      c. එම කෘමියාගේ හානියේ ස්වභාවය සඳහන් කරන්න.
   iii. රසායනික පළිබෝධ  නාශක ක්ෂේත්‍රයේ ඉසින අවස්ථාවේ දී අනුගමනය කළ යුතු පිළිවෙත් දෙකක් සඳහන් කරන්න.

05. ශිල්පීය ක්‍රම මගින් ශාක ප්‍රචාරණය කිරීමේ දී බද්ධ කිරීම වඩාත් ඵලදායි ක්‍රමයකි.
   i. a. අංකුර බද්ධය හා රිකිලි බද්ධය අතර වෙනස පැහැදිලි කරන්න.
      b. බද්ධ කිරීම සඳහා අනුජයක් තෝරාගැනීමේ දී සැලකිය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.
   ii.a. ස්වභාවික වර්ධක ප්‍රචාරණ ව්‍යුහ හතරක් නම් කරන්න.
      b. ස්වභාවික වර්ධක ප්‍රචාරණ ක්‍රමයේ වාසි හතරක් සඳහන් කරන්න.
   iii.a. ශාක අතු බැඳීම යන්න අර්ථ දක්වන්න.
      b. අතු බැඳීමේදී පොතු වලයක්  ඉවත් කිරීමට හේතුව සඳහන් කරන්න.
      c. පටක රෝපණ ක්‍රමයේ වාසි දෙකක් හා අවාසි දෙකක් සඳහන් කරන්න.

06. කෘෂිකර්මාන්තයේ දී ආහාර පරිරක්ෂණය අස්වනු නරක් වීම හා අපතේ යාම අවම කිරීම සඳහා යොදාගත හැකි විසඳුමකි.
   i. a. ආහාර නරක් වීම යනු කුමක් ද?
      b. ආහාර නරක් වීමට බලපාන භෞතික සාධක දෙකක් සඳහන් කරන්න.
   ii. a. ආහාර පරිරක්ෂණයේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.
      b. ආහාර පරිරක්ෂණයේ ප්‍රධාන මූලධර්ම දෙක සඳහන් කරන්න.
      c. මස් හා චීස් නිෂ්පාදනයේ දී භාවිත කරන නිර්දේශිත පරිරක්ෂක ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
   iii. අස්වනු අපතේ යාම අවම කිරීම සඳහා අස්වනු පරිහරණයේදී පසු අස්වනු හානිය කෙරෙහි අවධානය යොමු කළ යුතුය.
      a. අස්වනු අලෙවියේ දී පසු අස්වනු හානිය අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.
      b. පසු අස්වනු හානි අවම කිරීමෙන් ලබාගත හැකි වාසි තුනක් සඳහන් කරන්න.

07. මිනිසාගේ ප්‍රෝටීන අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා සත්ත්ව නිෂ්පාදන යොදා ගන්නා අතර ක්‍රමානුකූලව සත්ත්ව පාලන කටයුතු සිදු කළ යුතුවේ.
   i. ශ්‍රී ලංකාව තුළ සත්ත්ව පාලනය දියුණු කිරීමට පවතින විභවයන් දෙකක් සඳහන් කරන්න.
   ii. a. දැනට ශ්‍රී ලංකාවේ කුකුළන් ඇති කිරීම සඳහා බහුල වශයෙන් යොදාගන්නා ක්‍රමය සඳහන් කර එහි වාසි දෙකක් සඳහන් කරන්න.
      b. මස් ලබා ගැනීම සඳහා ඇති කරනු ලබන කුකුළන් වර්ග දෙකක් සඳහන් කරන්න.
      c. බ්‍රොයිලර් සතුන් ඇති කිරීම සඳහා පැටවුන් මිලදී ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු හතරක් සඳහන් කරන්න.
   iii. a. ගව දෙනුන් සඳහා බහුලව වැළදෙන බුරුළු ප්‍රදාහයේ රෝග කාරකයා නම් කරන්න.
      b. මෙම රෝගය නිසා බුරුල්ලේ සිදුවන වෙනස්කමක්  හා කිරිවල සිදුවන වෙනස්කමක් බැගින් සඳහන් කරන්න.
      c. මෙම රෝගය වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.